# දෙසතිය සඟරාව හා ජාතික සංවර්ධනය
## (සන්නිවේදනය හා රාජ්‍ය ප්‍රකාශන පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක්)


කේ.ආර්.එන්. හේමාලි රණසිංහ

FGS/M/MSSC/2005/17


සමාජීය විද්‍යාපති උපාධිය (MSSC)


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1232 |
| වර්ග අංකය: | |



සමාජීය විද්‍යාපති-ජනසන්නිවේදනය

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව


2015 මාර්තු

## සංක්ෂේපය

රූප ශබ්ද සහිත භාෂාවත් , දියුණු තාක්ෂණයත් මුහු කෙරුණු අංකිත ලෝකයක අද මිනිසා ස්වකීය දෛනික චර්යාවන් දියත් කරයි. සන්නිවේදනය යනු එතරම් සමාජ බලපෑම් සහිත සුවිශාල ලෙස පැතිරුණු ක්‍රියා පද්ධතියකි .

ජාතික සංවර්ධනය යන සංකල්පය ඒකායන ක්ෂේත්‍රයකට පමණක් සීමා කළ නොහැකි රටක විවිධ වූ ක්ෂේත්‍ර පුරා පැතිරිය යුතු ධර්මතාවකි. ආර්ථික සංවර්ධනය මූලික වූ සමාජ සංවර්ධනය වශයෙන් ප්‍රධාන අංශ කිහිපයකට ජාතික සංවර්ධනය වෙන්කළ හැකිය.

සංවර්ධනාත්මක සන්නිවේදනයෙහිලා ප්‍රධාන වශයෙන් ජන සන්නිවේදනයත්, අප්‍රධාන වශයෙන් පුද්ගලාන්තර සන්නිවේදනයත් භාවිත කෙරේ. සංවර්ධනය උදෙසා රටක ජනතාවගේ මානසික පසුබිම සකස් කිරීමට, ආකල්පමය වෙනස, සහභාගිත්වය යන අපේක්ෂාවන් ඉටුකර ගැනීමට විධිමත් සන්නිවේදන ක්‍රමවේදයක් උපයෝගී කර ගැනීම සංවර්ධනාත්මක සන්නිවේදනයයි.

සඟරාව යනු ආරක්ෂිත ලේඛනයකි. මුද්‍රිත මාධ්‍යයේ ප්‍රබල සන්නිවේදන අවියක් ලෙස සඟරාව හැඳින්විය හැකිය. මුළු ලොවම පුවත් ඇඟිලි තුඩු මතින් හැසිරවිය හැකි පරිසරයක දෙසතිය වැනි සඟරාවක් එම අභියෝග ජය ගන්නේ කෙසේ ද?

පුද්ගලයාගේ විඥානය සැකසීමට (දැනුම, ආකල්ප, බුද්ධිය) දෙසතිය දායකවන ආකාරයත් ආර්ථික, සමාජයීය, දේශපාලන, සදාචාරාත්මක, සංස්කෘතික වශයෙන් සමාජයට බලපෑමක් කිරීමේ ශක්‍යතාව දෙසතිය සතු ද යන්න විමසා බැලීමත් අධ්‍යයනය සඳහා වැදගත්ය. රාජ්‍ය ප්‍රකාශනයක් ලෙස දෙසතිය සඟරාව සංවර්ධන කාර්යයෙහිලා සන්නිවේදනමය දායකත්වයක් සිදු කරයි යන්න උපන්‍යාසය ලෙස යොදා ගැනිණි.

මාධ්‍ය සන්නිවේදනය සංවර්ධනය සඳහා යොදා ගැනීමේ දී තොරතුරු ප්‍රමුඛ වේ. මාධ්‍ය සංවර්ධනය සඳහා නම් එම මාධ්‍ය ජනයාගේ හඬ විය යුතුය. මාධ්‍ය ජනයාගේ සංවර්ධනයට වාහකයක් විය යුතුය. දෙසතිය සඟරාව මෙය ඉටු කරන්නේ කෙසේ ද? යන්න හඳුනා ගැනීම මූලික අරමුණය. රාජ්‍ය ප්‍රකාශන අතර දෙසතිය සුවිශේෂී වන්නේ ඇයි? මේ පිළිබඳව අවධානය යොමු කරන අතර දෙසතිය හමුවේ වර්තමානයේ ඇති ගැටලු හඳුනා ගැනීම ද, දෙසතිය සඟරාව නැවත ජනප්‍රිය කරවීමට කළ යුතු ඉදිරි පියවර හඳුනා ගැනීමක් ද සිදු කෙරෙයි.

**ඉඟි පද**

"ජාතික සංවර්ධනය", " සංවර්ධන සන්නිවේදනය", "සඟරාව", "දෙසතිය සඟරාව", "සමාජ බලපෑම"

# Abstract

Contemprary man is engaged in his daily activities in a digital world which the language with shapes and sounds and the advanced technology is merged. Communication is a vastly expanded system with a greater social impact.

National Development of a country does not limit to a certain field but should prevail in various fields in a country. It could be divided into several categories including economic development and social development.

Mass Media in general and interpersonal communication slightly are used in developmental communication. Developmental Communication is the use of a formal communication method in achieving the objectives of building the psychological background of people, attitudinal change and participation for the development of a country.

Magazine is a protected document. It can be introduced as a powerful communication tool in print media. How can Desathiya Magazine face that challenge in an environment where the worldwide news can be accessed with one's fingertips?

It is important to study how Desathiya contributes in developing individual's consciousness (knowledge, attitudes, intelligence), and whether it has the ability of influencing the society in economic, social, political, moral, and cultural aspects.

Hypothesis of the study was that Desathiya Magazine as a government publication makes a communicational contribution in development process.

Information is the priority object in using media communication in development. If the media is for development it should be the voice of public. It should be a conveyer towards people's development. Basic objective is to identify how Desathiya achieve this goal. Why Desathiya is special among government publications? These should be taken into account and identification of present issues confronted by Desathiya and further steps to be taken in popularizing the Desathiya again will also be studied.


Key words – "National Development", "Developmental Communication", "Magazine", "Desathiya Magazine", "Social Impact"